# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


| මගේ අංකය<br>எனது இல<br>My No | DSD/HO/04/LH/07/Compost-2022 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | ........................ | දිනය<br>திகதி<br>Date | 2022.03.03 |
|---|---|---|---|---|---|

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂවරුන්,
සියළුම සමෘද්ධි කළමණාකරුවන් හා සමෘද්ධි සංවර්ධන නිලධාරින් වෙත,

## කාබනික පොහොර නිෂ්පාදන ඒකක පිහිටුවීම - 2022

උක්ත වැඩසටහන සම්බන්ධයෙන් අංක DSD/HO/04/ER/09 හා 2021.06.07 දිනැති ලිපිය සහ DSD/HO/04/09/ER/ගෙවතු/2022 හා 2022.02.17 දිනැති ලිපි හා බැඳේ.

02. ගෘහාශ්‍රිත සුපිරිසිදු වටපිටාවකින් යුත් පරිසරයක දෛනික පරිභෝජනයට අවශ්‍ය වන වසවිසෙන් තොර නැවුම් එළවළු, පලතුරු,පලා වර්ග සහ අල වර්ග ගෙවත්ත තුලින් අන්‍යෝන්‍ය සහයෝගයෙන් සපුරා ගනිමින් මනා ශාරිරික හා මානසික සෞඛ්‍යයෙන් හෙබි ස්වයංපෝෂිත පවුල් ඒකක වලින් සැදුම්ලත් නිරෝගී සම්පන්න ජනතාවක් බිහි කිරීමේ ප්‍රධාන අරමුණින් "හරිත දැයක් ජාතික ගෙවතු වගා සංග්‍රාමය" දිවයින පුරා ක්‍රියාත්මක කිරීමේදී කාබනික පොහොර සඳහා ප්‍රධාන ස්ථානයක් හිමිවනු ඇත. ඒ අනුව කාබනික පොහොර භාවිතා කිරීම හා දිරිගැන්වීම තුළින් නව ආහාර රටාවක් බිහි කිරීමට රජය නිරන්තරයෙන් කටයුතු කරමින් සිටී.

03. කොම්පෝස්ට් පොහොර නිෂ්පාදන ඒකක ආරම්භ කිරීම, වැඩි දියුණු කිරීම ජාතික අවශ්‍යතාවයක් වී ඇති බැවින් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් මෙම වර්ෂයේ දී දිවයින පුරා සෑම ග්‍රාම නිලධාරී වසමක්ම ආවරණය වන පරිදි කාබනික පොහොර නිෂ්පාදකයෙකු හඳුනාගෙන ගුණාත්මක බවින් යුතු කාබනික පොහොර නිෂ්පාදනය කිරීම තුළින් තම ගෙවතු වගාව ඇතුළුව ප්‍රදේශයේ අනෙකුත් ගොවීන්ට අවශ්‍ය කාබනික පොහොර අවශ්‍යතාවය සපුරාලීමට වානිජ මට්ටමින් මෙම ව්‍යාපෘතිය දිරිගැන්වීමට නියමිතය. 2022 වර්ෂයේ දී මේ සඳහා හඳුනාගනු ලබන කාබනික පොහොර නිෂ්පාදකයින්ට තම නිෂ්පාදනයන්හි ගුණාත්මක තත්ත්වය වැඩි දියුණු කර ගැනීමට අවශ්‍ය තාක්ෂණික දැනුම ලබාදීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පුහුණු වැඩසටහන් පැවැත්වීමට සැලසුම් කර ඇත.

04. ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ නිර්ණායකයන්

සෑම ග්‍රාම නිලධාරී වසමකින්ම මූලික වශයෙන් පහත සඳහන් නිර්ණායකයන් සපුරාලන ප්‍රතිලාභීන් තෝරා ගැනීම සුදුසු වේ.

i. සමෘද්ධිලාභියෙකු හෝ අඩු ආදායම්ලාභියෙකුවීම.
ii. ව්‍යාපෘතිය සඳහා උනන්දුව, කැමැත්ත සහ කැපවීමේ හැකියාව ඇති අයෙකු වීම.
iii. කාබනික පොහොර නිෂ්පාදනය සඳහා ප්‍රමාණවත් ඉඩකඩ, ජලය, අමු ද්‍රව්‍ය සපයා ගැනීමේ හැකියාව තිබීම.
iv. කාබනික පොහොර නිෂ්පාදන ඒකකය වෙත ප්‍රවාහන කටයුතු සඳහා මාර්ග පහසුකම් පැවතීම.
v. ඉදිරියේදී කාබනික පොහොර නිෂ්පාදනය වාණිජ මට්ටමින් හෝ විශාල පරිමාණයෙන් වැඩි දියුණු කර ගැනීම සඳහා කැමැත්තක් දක්වන පුද්ගලයෙකු වීම.
vi. ප්‍රජා මූල සංවිධානයක් ලෙස ද මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක කළ හැකිවීම.

D/Live/Nan/Org.Fer. 3.02


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல/1st Step, 4 th floor, Sethsiripaya Battaramull

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011 |

05. තෝරාගත් ප්‍රතිලාභීන් CRM පද්ධතියට ඇතුලත් කිරීම.

- crm.esamurdhi.gov.lk යන වෙබ් ලිපිනය හෝ අපගේ නිල වෙබ් අඩවියේ ඇති crm login තුලින් CRM මොඩියුලයට ඇතුලත්වී ග්‍රාම නිලධාරී වසම් හෝ සමෘද්ධි බැංකුවේ user භාවිතා කරමින් Project Application 2021 තුලට පිවිස Add බටනයෙන් කාබනික පොහොර නිෂ්පාදකයන්ගේ තොරතුරු ඇතුලත් කරනු ලබන form එකට ඇතුලත් විය යුතුය.
- එම පෝරමය තුල ඇති කාබනික පොහොර නිෂ්පාදකයන්ගේ පුද්ගලික තොරතුරු සම්පූර්ණ කර Project Category තුලින් Home Garden Programme 2022 තෝරාගන්න.
- එලෙස තෝරාගත්විට Category of Project That are expected to be implemented තුල Agriculture යටතේ "Plant Nursery Owner / පැල තවාන් කරු" සහ "Organic Fertilizer Producer /කාබනික පොහොර නිෂ්පාදකයා" යන්න දිස්වෙන අතර ඉන් "Organic Fertilizer Producer කාබනික පොහොර නිෂ්පාදකයා" තෝරන්න.
- මෙම පෝරමය තුල අවශ්‍ය තොරතුරු පමණක් සම්පූර්ණ කර (ව්‍යාපෘති කරනු ලබන ආයෝජන යන්න අවශ්‍ය නොවේ) Submit කිරීම තුලින් කාබනික පොහොර නිෂ්පාදකයා CRM පද්ධතියට ඇතුලත් කළ හැකිය.
- ඇතුලත් කර ඇති තොරතුරු Reports තුල ඇති Project Application Detail Report තුලින් බලා ගත හැකිය.
- හඳුනාගත් කාබනික පොහොර නිෂ්පාදකයන්ගේ තොරතුරු CRM මොඩියුලයට ඇතුලත් කර එම තොරතුරු 2022.03.15 දිනට පෙර CRM මොඩියුලය තුළින් අප වෙත ලබාදීමට අවශ්‍ය පියවර ගත යුතු වේ.

2021 වර්ෂයේ CRM මොඩියුලයට ඇතුළත් කරන ලද කාබනික පොහොර නිෂ්පාදකයින් අතුරින් ඉහත නිර්ණායක සපුරාලන ප්‍රතිලාභීන් සිටීනම් මෙම වර්ෂය සඳහා නැවත ඇතුළත් කරන ලෙස කාරුණිකව දන්වමි.

06. පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම

මෙම තෝරාගත් ප්‍රතිලාභීන් සඳහා කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුවක් ප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශක හෝ සුදුසු සම්පත්දායකයෙකු සම්බන්ධ කර ගනිමින් ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා සිදු කළ යුතුය. කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය, ඇසුරුම්කරණය හා අලෙවිකරණය සහ කාබනික දියර පොහොර භාවිතය ආදිය පිළිබඳ දින ½ ක පුහුණු වැඩසටහනක් පැවැත්වීම ප්‍රමාණවත් වන බැවින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ගොවිජන සේවා මධ්‍යස්ථාන වලට ප්‍රතිලාභීන් කැඳවා පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු කළ යුතු වේ.

07. පුහුණු වැඩසටහන් සඳහා ප්‍රතිපාදන ඉල්ලුම් කිරීම

එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම සුදුසු වන අතර එක් කොට්ඨාශයක ප්‍රතිලාභීන් සංඛ්‍යාව වැඩි / අඩු නම් අදාල ගොවිජන සේවා මධ්‍යස්ථාන අනුව ප්‍රතිලාභීන් සංඛ්‍යාව ගලපා ගැනීම වුව ද කළ හැකිය.

එක් පුහුණු වැඩසටහනකට සහභාගී වන ප්‍රතිලාභීන් සංඛ්‍යාවට (සම්පත්දායකයින් සහ ව්‍යාපෘති කළමණාකරු ඇතුළු නිලධාරීන්) අමතරව 5 ක සංඛ්‍යාවක් සම්බන්ධ කළ හැකි අතර කෙටි කෑම සමඟ තේ සඳහා එක් පුද්ගලයෙකුට රු.125/- ක් ද, ලිපි ද්‍රව්‍ය සඳහා රු. 50/- ක් ද වෙන් කළ හැකි වේ. මීට අමතරව එක් වැඩසටහනක් සඳහා පරිපාලන වියදම් ලෙස රු.2,000/- ක් ඉල්ලුම් කළ හැකි වේ.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ඇස්තමේන්තුව සකස් කර දිස්ත්‍රික් සාරාංශය මාර්තු 18 දිනට පෙර ජීවනෝපාය සංවර්ධන අංශය වෙත jeevonopaya@gmail.com හෝ divinegumalh@yahoo.com විද්‍යුත් තැපැල් ලිපිනයන් ඔස්සේ ලබා දෙන ලෙස කාරුණිකව දන්වමි.

08. මෙහෙයවීම අධීක්ෂණය සහ ප්‍රගති සමාලෝචනය

* දිස්ත්‍රික් ලේකම් /දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්.
* දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ
* ප්‍රාදේශීය ලේකම්
* නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ
* මූලස්ථාන කළමණාකරු/මහා සංගම් කළමණාකරු / ව්‍යාපෘති කළමණාකරු
* අදාල වසමෙහි සමෘද්ධි සංවර්ධන නිලධාරීන්

සෑම දෙසතියකට වරක් කලාප රැස්වීමේදී මෙම ව්‍යාපෘතියේ ප්‍රගතිය හා ගැටළු සාකච්ඡා කළයුතු අතර අදාල මස ප්‍රගතිය, සෑම මසකම ඊලඟ මස 05 දිනට පෙර දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වෙත වාර්තා කළ යුතු අතර දිස්ත්‍රික් සාරාංශ වාර්තාව සෑම මසකම 08 දිනට පෙර අධ්‍යක්ෂ ජීවනෝපාය සංවර්ධන වෙත jeevonopaya@gmail.com හෝ divinegumalh@yahoo.com මඟින් යොමු කළ යුතුය. මෙම ව්‍යාපෘතිය නිරන්තර පසුවිපරම,මෙහෙයවීම හා අධීක්ෂණය කිරීම තුළින් මෙම ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට හැකි වනු ඇත.

09. ව්‍යාපෘති කාල රාමුව

| ක්‍රියාකාරකම | කාල වකවානුව |
|---|---|
| 1. ප්‍රතිලාභීන් හඳුනාගැනීම සහ CRM පද්ධතියට ඇතුළත් කිරීම | 2022 මාර්තු 15 දිනට පෙර |
| 2. පුහුණු වැඩසටහන සංවිධානය කිරීම හා ප්‍රතිපාදන ඉල්ලුම් කිරීම | 2022 මාර්තු 18 දිනට පෙර |
| 3. කොම්පෝස්ට් පොහොර නිෂ්පාදන ව්‍යාපෘති ආරම්භ කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් පැවැත්වීම | අප්‍රේල් 10 දිනට පෙර |
| 4. පසු විපරම | අඛණ්ඩව වසර පුරාම |

10. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වියදම් තමන් විසින්ම හෝ රජයේ ආධාර හෝ බැංකු මඟින් ලැබෙන සහන ණය ක්‍රමය යටතේ ගලපා ගැනීමට කටයුතු කළ යුතුය.

11. ඉදිරියේදී ජාතික පොහොර ලේකම් කාර්යාලය ද මෙම කාබනික පොහොර නිෂ්පාදන වැඩසටහන සමඟින් ඒකාබද්ධව කටයුතු කිරීමට අපේක්ෂා කරන අතර ඒ අනුව මෙම වැඩසටහන දීපව්‍යාප්තව ක්‍රියාත්මක වනු ඇත.

ජාතික අවශ්‍යතාවයක් වන මෙම ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට ඔබ ඇතුළු කාර්යය මණ්ඩලයෙන් ලැබෙන සහයෝගය ඉතා අගය කොට සලකමි.

ආර්.පී.බී.තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:-

1. ලේකම්, සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.
2. ලේකම්, ජාතික සම්බන්ධීකරණ ජීවනෝපාය අනු කමිටුව, ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යය සාධන බලකාය - කා.දැ.ගැ.පි.
3. ලේකම්, ගම සමඟ පිළිසඳර, ග්‍රාමීය සංවර්ධන, ජනාධිපති කාර්යය සාධන බලකාය - කා.දැ.ගැ.පි.
4. ලේකම්, කාබනික පොහොර නිෂ්පාදන ප්‍රවර්ධනය හා සැපයුම් නියාමන සහ වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු,පලතුරු,මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධනය, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.
5. කමිටු ප්‍රධානී, ගෘහ ආර්ථික හා පෝෂණ සුරක්ෂිතතා කමිටුව, ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යය සාධන බලකාය - කා.දැ.ගැ.පි.
6. ගොවිජන සේවා කොමසාරිස් ජනරාල්, ගොවිජන සංවර්ධන අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි හා අ.ක.ස
7. අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි හා අ.ක.ස
8. අධ්‍යක්ෂ ජනරාල්, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි හා අ.ක.ස
9. සියළුම පළාත් කෘෂි අධ්‍යක්ෂවරුන්, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි හා අ.ක.ස
10. ප්‍රධාන ගණකාධිකාරී, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි හා අ.ක.ස
11. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි හා අ.ක.ස